---

මැදදුම්බර ප්‍රාදේශිය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 18 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දි, උපචිත පදනම අනුගමනය කිරීමෙන් තොරව වෙළඳ බලපත්‍ර ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීමෙන් රැස් කරන ලද රු.129,000 ක ආදායම් වර්ෂයේ ආදායමක් ලෙස සැළකීමෙන් තොරව සමුච්චිත අරමුදල ගිණුමට සෘජුවම බැර කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයන්හිදි කලින් ලද කඩ කුළී ගිණුම්ගත කිරීම සඳහා ජ'නල් සටහන් අංක 36 මගින් සමුච්චිත අරමුදල රු.1,520,144 කින් හර කර කඩ කුළී ගිණුම බැර කර තිබුණි. ඉකුත් වර්ෂයන්හි දි අය කළ එම ගාස්තු සමුච්චිත අරමුදලට බැර කර නොතිබිය දි, එසේ කිරීමෙන් සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිග හිටි ප්‍රාග්ධන ආධාර රු.24,839,957 ක ශේෂය තුළ ප්‍රාග්ධන ආධාර යටතට නොගැනෙන රු.7,077,164 ක් වූ ශේෂයන් ද ඇතුළත් කර තිබුණි.

1.3.3 නොසැසඳූ ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අනුව ශේෂය රු.25,916,853 ක් වූ අතර, උපලේඛනය අනුව ශේෂය රු.26,147,041 ක් වූයෙන් රු.230,188 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.59,413,849 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,705,542 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,823,186 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 1,165 | 1,228 | 1,923 |
| (ii) | බදු කුලී | 4,355 | 3,874 | 1,818 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,200 | 1,039 | -- |
| (iv) | වෙනත් ආදායම් | 8,867 | 11,363 | 11,363 |

2.2.2 ජල ගාස්තු

අම්බාල, මැද මහනුවර, ගල්කැලේ, උඩිස්පත්තුව යන ජල යෝජනා ක්‍රම යටතේ නිවාස හා ව්‍යාපාරික ස්ථානවලට ලබා දී තිබූ ජල මනු 183 ක් ක්‍රියා විරහිත වී තිබුණි. එයින්, මනු 144 ක්ම වර්ෂයකට වැඩි කාලයක සිට අක්‍රීයව තිබූ අතර, කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කිරීමෙන් තොරව ජල සම්බන්ධතා වෙනුවෙන් මාසිකව රු.200 බැගින් ස්ථාවර ජල ගාස්තු අය කර තිබුණි.

2.2.3 <u>පරිසර බලපත්‍ර ගාස්තු.</u>

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ වූ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/ 16 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත ව්‍යාපාර සඳහා පරිසර බලපත්‍ර ලබා ගතයුතු වුව ද, ව්‍යාපාරික ආයතන 19 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබූ අතර, ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවට රු.140,600 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 612,602 |
| (ii) මුද්දර ගාස්තු | 7,005,934 |

2.2.5 <u>වෙළඳ බලපත්‍ර ගාස්තු.</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් 13 ක් පැවති බවට සභාව මගින් හඳුනා ගෙන තිබුණ ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර ආදායම් පදනම් කර බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළයුතු වුව ද, එපරිදි කටයුතු නොකර, හෝටල් 11 කින් රු.3,000 බැගින් ස්ථාවර බලපත්‍ර ගාස්තුවක් අය කර තිබුණි.

(ආ) වාර්ෂික සමීක්ෂණ වාර්තා අනුව, ව්‍යාපාර 39 ක් සඳහා රු.32,600 ක් වූ කළ බිල් කිරීම්, ආදායම් ලේඛනවලට ඇතුලත් කර අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාර නිසි අනුමැතිය ලබා නොගෙන කර්මාන්ත ණයගැතියෝ රු.4,121,715 ක් ජ'නල් සටහන් අංක 24 මගින් සමුච්චිත අරමුදල මගින් කපා හැර තිබුණි.

---

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 175(1) වගන්තිය ප්‍රකාර නිසි අධිකාරි බලයකින් තොරව සමාලෝචිත වර්ෂයේ අනියම් සේවකයින් 13 දෙනෙකු බඳවා ගෙන රු.1,677,345 ක මුදලක් ගෙවා තිබුණි.

2.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) <u>මාගොඩ රඹුක්පොත ගම මැදින් දිවෙන මාර්ගයේ කපුකනගේ හන්දියේ සිට ප්‍රතිසංස්කරණය කිරිම.</u>

ඇස්තමේන්තුගත වියදම රු.1,000,000 ක් වූ මෙම කර්මාන්තයේ වැඩ විෂය අංක 03 යටතේ, 1:2:4 (3/4") සිමෙන්ති කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් මාර්ගය 4" ක් ඝනකමට කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තු කර තිබුණ ද, 2013 ජනවාරි 22 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දි දික් අඩි 85 ක් 3" ක් ඝනකමට ද, දික් අඩි 36 ක් 3 ½ '' ක් ඝනකමට ද කොන්ක්‍රීට් අතුරා තිබුණි. ඇස්තමේන්තුවේ සඳහන් නියමන්ට අනුව, මාර්ගය කොන්ක්‍රීට් නොකිරිම හේතුවෙන්, මාර්ගයේ ශක්තිමත්භාවය මෙන්ම එහි දීර්ඝ කාලීන පැවැත්ම පිළිබඳව විගණනයේ දි සැහිමකට පත් වීමට නොහැකි විය.

(ආ) <u>සඳසිරි දුනුවිල ග්‍රාමයේ ළිඳට 4'-2' සිලින්ඩර වළලු ලබා දීම.</u>

රු.27,700 ක් වැය කර 2012 දෙසැම්බර් 24 දින මිල දි ගෙන තිබූ සිලින්ඩර වළලු 08 ක්, 2013 ජනවාරි 29 දින වන විටත්, අදාළ කාර්යයට යොදවා නොතිබුණි.

(ඇ) <u>නමදගල වසමේ ජල ටැංකියක් ඉදි කිරිම.</u>

(i). ඇස්තමේන්තුව අනුව, රු.332,346 ක වියදමක් මත ජල ටැංකියක් ඉදි කිරිමට ඇස්තමේන්තු කර තිබුණ ද, ඇස්තමේන්තු සංශෝධනයකින් තොරව එම ව්‍යාපෘතියට අදාළව රු. 1,000,000 ක වියදමකින් ජල ටැංකි 02 ක් ඉදි කර තිබුණි.

(ii). ගිවිසුමේ 04 වන කොන්දේසීය ප්‍රකාරව කර්මාන්තය නිම කර භාර දීමට ප්‍රමාද වන එක් එක් සතිය හෝ ඉන් කොටසක් වෙනුවෙන් රු.1,750 ක මුදලක් ප්‍රමාණ කළ අලාභයක් වශයෙන් කොන්ත්‍රාත්කරුගෙන් අය කළයුතු වුවත්, ප්‍රමාද වූ මාස 02 ක කාල සීමාව වෙනුවෙන් රු.14,000 ක ප්‍රමාද ගාස්තු අය කර ගෙන නොතිබුණි.

(iii). ජල ටැංකි ඉදිකරන ලද භූමීය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

2.5 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 වගන්තිය ප්‍රකාරව අවස්ථා 460 ක දී කල් ඉකුත් වූ රු.328,750 ක තැන්පතු සම්බන්ධයෙන් අදාළ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේ දී විශ්‍රාමික නිලධාරින් දෙදෙනෙකුට පාරිතෝෂික ගෙවීම් සඳහා විශ්‍රම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලද රු.704,263 ක පාරිතෝෂික මුදල අදාළ විශ්‍රාමික නිලධාරින්ට ගෙවීමෙන් තොරව 2012 දෙසැම්බර් 31 දින වන විටත් තැන්පත් යටතේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 2008 හා 2009 වර්ෂවල දි අය කර ගෙන තිබූ රු.156,166 ක් වූ එකතු කළ අගය මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර, ණයහිමියන් යටතේ රඳවා ගෙන තිබුණි.

(ඈ) අය විෂයන් 3 ක් යටතේ හිඟ හිටි ආදායම රු.4,608,734 ක් වූ අතර, එම ආදායම් අය කර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව සහ ප්‍රාදේශීය සභා පනතේ 166 වගන්තිය ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2012 වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.240,000 ක් වටිනා කොම්පෝස්ට් බැරල් තොගයක් 2013 ජුනි අවසාන වන විටත් බෙදා නොහැර සභා භූමිය තුළ ගබඩා කර තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය